# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2326/13 – 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා – 2023.04.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/41.
IR/COM/02/2018/42.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.05.25 දිනැති හා අංක 2281/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.05.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. කහදූව, පිනිකහන හි පදිංචි කේ. පී. ජේමසිරි මයා 2. පන්නිපිටිය, බ්‍රාහ්මණගම, වික්‍රමගේ මාවත, අංක 32/ඒ9 හි පදිංචි බී. ඒ. ධර්මසේන ජයන්ත මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් නිමල් පියරත්න මයා - සභාපති, අවන්ඛ හේරත් මයා - නායක, නලින් ජයතිලක මයා - සාමාන්‍යාධිකාරි, ඩබ්. ඒ. කේ. ප්‍රනාන්දු මයා - උපනායක, නවීන් ද සිල්වා මයා - සංවර්ධන හා ඉදිකිරීම් ලේකම්, සංජීව වික්‍රමනායක මයා - (ගොල්ෆ් පිට්ටනිය භාර) ලේකම්, සුරේන් මදනායක මයා - ආහාරපාන තැබෑරුම් අවන්හල හා පරීක්ෂක ලේකම්, සනෙත් ගමගේ මයා - භාණ්ඩාගාරික, වසන්ත ද සිල්වා මයා - වෙළෙඳ කටයුතු හා සංවර්ධන ලේකම් කොළඹ 08, මොඩල් ෆාම් පාර, අංක 223 හි පිහිටි රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 039277 – 18 (2023/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී.**

ගොනු අංකය - IR/COM/01/2018/41.
IR/COM/02/2018/42.

බේරුම්කරණ අංක - A/22/2022.

1. කේ. පී. පේමසිරි මයා. (මියගොස්)
පිනිකහන,
කහදූව.

2. බී. ඒ. ධර්මසේන ජයන්ත මයා.
32/A9, වික්‍රමගේ මාවත,
බ්‍රාහ්මණගම,
පන්නිපිටිය.

*පළමු පාර්ශ්වය*

සහ

අනෙක් පාර්ශ්ව වශයෙන්,

| | |
|---|---|
| නිමල් පියරත්න මයා | - සභාපති |
| අවන්බ හේරත් මයා | - නායක |
| නලින් ජයතිලක මයා | - සාමාන්‍යාධිකාරි |
| ඩබ්. ඒ. කේ. ප්‍රනාන්දු මයා | - උපනායක |
| නවීන් ද සිල්වා මහතා | - සංවර්ධන හා ඉදිකිරීම් ලේකම් |
| සංජීව වික්‍රමනායක මයා | - (ගොල්ෆ් පිට්ටනිය භාර) ලේකම් |
| සුරේන් මදනායක මයා | - ආහාරපාන තැබෑරුම් අවන්හල හා පරීක්ෂක ලේකම් |
| සනෙත් ගමගේ මයා | - භාණ්ඩාගාරික |
| වසන්ත ද සිල්වා මයා | - වෙළෙඳ කටයුතු හා සංවර්ධන ලේකම් |

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්
අංක 223,
මොඩල් ෆාම් පාර,
කොළඹ 08,

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ් ආයතනයේ වර්ෂ 10 කට වැඩි සේවා කාලයක් සහිත විශ්‍රාම ගිය ඇතැම් සේවකයින්ට සාමාන්‍ය පාරිතෝෂික දීමනාවට අමතරව ගෙවන ලද (exgratia) දීමනාව, මෙම ආයතනයේ සේවය කරන ලද කේ. පී. පේමසිරි මයා (ප්‍රධාන අයකැමි) හා බී. ඒ. ධර්මසේන ජයරත්න මයා (කාර්යාල කාර්ය සහයක) යන දෙදෙනාට ලබා නොදීම තුළින් අසාධාරණයක් සිදු වී ඇත් ද එසේ සිදුවී තිබේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

මෙම ආරාවුල සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ හා දෙවන පාර්ශ්වයේ පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව පරීක්ෂණය ආරම්භ කරන ලදී.

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම -**

2022.06.01 පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාර බී. ඒ. ධර්මසේන ජයන්ත පැමිණ සිටින ලද අතර, කේ. ජී. පේමසිරි නමැති 2 වන ඉල්ලුම්කරු මියගොස් ඇති බවත් අංක 2572 දරන මරණ සහතිකය 2022.08.30 දින ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සුරේන් ඥාණරත්න මහතා සමග තෙනුර සමරසූරිය පෙනී සිටින ලදි.

මෙම නඩුව 2022.06.01, 2022.08.30 සහ 2022.11.24 වැනි දිනවල දී බේරුම්කාර මා ඉදිරියේ විවෘත අධිකරණයේ දී විමසීමට භාජනය කොට ඇති අතර, එම අවස්ථාවල දෙපාර්ශ්වය නීතිඥ නියෝජනයක් සහිතව පෙනී සිට ඇති අතර, දෙපාර්ශ්වයේ නීතිඥවරු හා දෙපාර්ශ්වය විසින් කරුණු දක්වා තම ස්ථාවරය දන්වා ඇත.

**ආරාවුලේ පසුබිම -**

මෙම ආරාවුල A53/2019 A, 114/2019 A, 35/2021 නඩු අංක යටතේ මීට පෙර පවත්වාගෙන ආ බවත්, එම නඩු අංක යටතේ ගොනු කර ඇති ලේඛන ඉහත අංකය යටතේ වන A 22/2022 දරන මෙම නඩුවට ආදේශ කර ගන්නා ලෙස පළමු පාර්ශ්වය ලිඛිතව ලිපියක් 2022.05.30 ඉදිරිපත් කරමින් ද සහ වගඋත්තරකාර පාර්ශ්වය 2022.08.30 දින විවෘත අධිකරණයේ දී ඊට එකඟතාවය පළ කර ඇත.

ඉල්ලුම්කාර බී. ඒ. ධර්මසේන ජයන්ත වගඋත්තරකාර ආයතනයට 1979 සේවයට පැමිණි බවත්, 2012 වැනි දින සේවයෙන් ඉවත් වූ බවත් දක්වමින් ඉහත කී ඉල්ලුම්කරුගේ 2016.05.05 දිනැති ලිපිය මගින් කම්කරු කොමසාරිස්වරයාගේ සහනයක් වශයෙන් ඔහු අයැද ඇත්තේ "අමතර පාරිතෝෂිකයක් ලබා ගැනීම පිළිබඳ අභියාචනය යනුවෙනි"

එහි සඳහන් කර ඇත්තේ වසර 33 ක සේවා කාලයක් සඳහා වසරකට පාරිතෝෂික වශයෙන් මාස 1/2 ක වැටුපක් ගෙවන ලද නමුත් ඔහුට ලැබිය යුතු සම්පූර්ණ පාරිතෝෂිකය එම මුදල නොවන බවත්, 1978 ජූලි මස 28 වැනි දින වගඋත්තරකාර ආයතනය ගන්නා තීරණයක් මත අඛණ්ඩව සේවා කාලය වසර 10 ක් ඉක්මවන සේවකයකු විශ්‍රාම යෑමේදී සෑම අවුරුද්දක් සඳහා මසක වැටුපක් ලබා දෙන බවත් ඒ අනුව එම සම්පූර්ණ මුදල ඉල්ලුම්කරුට හිමි විය යුතු බවත් ය.

නමුත් 2015.01.19 දිනැති RX03 දරන ලේඛනය අනුව වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කරුගේ සේවය 2012.06.11 වැනි දින අත්හිටුවීමෙන් පසුව නැවත 2012.06.09 දින බලපැවැත්වෙන පරිදි සේවයෙන් පහකොට ඇත. ඊට පදනම් වී ඇත්තේ ඉහත ඉල්ලුම්කරුට පැවති විශමාචාර චෝදනා මත කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු අංක 23498/12 දරන නඩු කෘත්‍යය බව පැහැදිළි වේ.

**ප්‍රදානය ලබාදීමට හේතු පාදක වූ කරුණු -**

පළමු පාර්ශ්වය විසින් තම ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලැබූ P 07 දරන ලේඛනයට ඇමුණුම් 01 වශයෙන් පාරිතෝෂික හිමි කර ගත් අයගේ නාම ලේඛනයක් සහ වවුචර 16 ක් ද වගඋත්තරකාර ආයතනයේ රැස්වීමක වාර්තාවක් ද (minutes) 1995.06.30 දිනැති සේවයෙන් ඉවත්වීමේ ලිපියක් ද 1995.03.10 රැකියාවෙන් ඉවත්වීමේ ලිපියක් ද ඉදිරිපත් කොට මෙම ආරාවුලට අදාළ ඉල්ලුම්කාර පාර්ශ්වය 2022.07.05 දින ලිපිය සමග P 01, P 02, P 03, P 04, P 05, P 06, P 07 වශයෙන් අංක කොට ලේඛන ඉදිරිපත් කොට ඇත. ඊට අමතරව ඉහත සඳහන් කරන දිනවල විවෘත අධිකරණයේ සැලකිරීම් වාර්තා කර ඇති අතර, 2022.10.17 වැනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් අතිරේක ලිඛිත දේශනයක් යනුවෙන් සැලකිරීම් ඉදිරිපත් කර ඇත. එය සමග X 01, X 02, X 03 වශයෙන් ලේඛන ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කරු ඉහත P 07 සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම්වල ඇති වවුචර් පත් මගින් උත්සාහ දරා ඇත්තේ එම වවුචර් පත්වල හිමි යන අයට "EX gratia" දීමනාව ගෙවා ඇති නම් තමන්ට ද එම මුදල හිමි විය යුතු බවයි. නමුත් ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර ඇත්තේ (Termination) ඔහුගේ වංචනික හා විශමාචාර ක්‍රියා හේතුන් බවත්, එකී වරද ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ මෙන්ම මෙම නඩුවට ඉදිරිපත් කරන ලද ලේඛන අනුව ඔහු පිළිගත් කරුණකි. ඊට අමතරව P 07 දරන ලේඛනය සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම් සහ වවුචර්පත් කිසිවක් ඉල්ලුම්කරුගේ ස්ථාවරය සනාථ කිරීමට සමත් නොවේ. හරයාත්මක සමානකමක් නොමැත.

ඉල්ලුම්කරු මුල් අවස්ථාවේ දී හෙළි නොකර ලද කරුණු අමතර ලිඛිත දේශනය සමග X 01, X 02, X 03 වශයෙන් ඉදිරිපත් කර ඇත.

X 01 ඉල්ලුම්කරු කම්කරු විනිශ්චයාධිකරණයේ පවරන ලද අංක 13/107/2015 දරන ඉල්ලුම්පත්‍රයයි. X 02 මූලික විරෝධතාවයට එරෙහි මහාධිකරණ නියෝගයයි. X 03 SC Appeal 185/17 දරන ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ සමථ තීන්දුවෙන් එහි සඳහන් වන්නේ 2019.12.10 දිනැති නේෂන් ට්‍රස්ට් බැංකුවේ රු, 350,000 ක මුදලක් As an ex gratia payment වශයෙන් අංක 030413 තවත් චෙක් මතයක් ලබාගෙන අංක 13/107/2015 දරන නඩුව ඉල්ලා අස්කර ගැනීමට එකඟ වී ඇත.

නමුත් මා නිරීක්ෂණය කරනුයේ ඉහත කී සමථයට එළඹෙන අවස්ථාවේ දී 2019.12.10 වන විට A22/2022 මෙම නඩුවෙන් ද සහනයන් අයදීමක් කර ඇති බවයි.

එසේම මෙම නඩු ගොණුවට ඉදිරිපත් කර ඇති A දරන ලේඛනය ඉල්ලුම්කරුට එරෙහිව වගඋත්තරකාර ආයතනයේ පැමිණිල්ලක් මත කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ පවත්වාගෙන යන ලද B 1564/12 හා නඩු අංක 23498/2/12 දරන නඩු වාර්තාවේ පිටපතකි.

එම නඩු වාර්තාව,

- ➢ ඉල්ලුම්කරු පැමිණිල්ල ගොනු කරන විට වරද පිළිගන්නා බවට සටහනක් ඇත.
- ➢ ඒ අනුව 2012.06.10 දින වන විට දින 06 ක් තුළ රු. 160,000 ක මුදලක් වගඋත්තරකාර ආයතනයේ නියෝජිත වෙත විවෘත අධිකරණයේ ගෙවා ඇත.

චෝදනා පත්‍රය ගොනු කිරීමට මුදල් ගෙවා ඇති නමුත් චෝදනා පත්‍රය ගොනු කිරීමෙන් අනතුරුව පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට නොපැමිණීම මත ඉල්ලුම්කරු නිදහස් වී ඇති බව නිරීක්ෂණය වේ.

**වගඋත්තරකරුගේ ස්ථාවරය -**

වගඋත්තරකරු 2022.11.24 වැනි දින ලිඛිත සැලකිරීම් සමග R X01, R X02, R 02 a, R X3, R X4, R X4 a, R X 05, R X5 a, R X06, R X06 a, R X07, R X9, R X9 a යනුවෙන් ලේඛන ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුගේ ස්ථාවරය වන්නේ ඉල්ලුම්කරුගේ RX 03 ලේඛනය මගින් සේවයෙන් පහ කරන ලද අයෙක් බවත් ඔහු විශ්‍රාමික අයෙක් නොවන බවත් ය.

එසේම R X9 හෙවත් P01 දරන වගඋත්තරකාර ආයතනයේ 1978.07.26 වැනි දින එම රැස්වීම් වාර්තාව තීරණය වනුයේ 1982 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සම්මත වීමට පෙර බවයි.

එසේම A දරන මෙන් ම R X2 දරන ඉල්ලුම්කරුට එරෙහිව ඔහුගේ වංචනික ක්‍රියාවක් හේතුවෙන් කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉල්ලුම්කරුට එරෙහිව පැවති නඩු අංක 23498/12 දරන නඩුවේ වරද පිළිගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දී රු. 160,000 ක මුදලක් ගෙවා ඇති බවයි. X2 a දරන ලේඛනය ඉදිරිපත් කර ඇත.

එසේම ඉල්ලුම්කරු විසින් මෙම ආරාවුල සම්බන්ධයෙන්ම කම්කරු විනිශ්චය සභාවේ පවත්වාගෙන ගිය නඩු අංක 13/07/2015 දරන නඩුවේ ලිඛිත දේශනය R X05 ලෙස සළකුණු කර ඇත. එහි 10 වන ඡේදය මගින් X05 a ලෙස සළකුණු කොට ඇත. එහි මෙසේ සඳහන් වේ.

''ඉල්ලුම්කරු මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවේ දී ඔහු විසින් කර ඇති විෂමාචාරය පිළිගෙන ඇති හෙයින් ද, ඉල්ලුම්කරුගේ සේවය වගඋත්තරකරු අවසන් කර ඇත්තේ මෙම කරුණු නිසා හෙයින් ද වගඋත්තරකරු ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත සහ සාධාරණ බව පැහැදිලිය. එය ඉල්ලුම්කරුගේ ස්ථාවරයයි.''

ඒ අනුව පළමු පාර්ශ්වය විශ්වාසය තබන P1 දරන ලේඛනය සම්මත කරගෙන ඇත්තේ 1978.06.26 වැනි දින වන අතර, 1983 අංක 12 දරන පාරිතෝෂික පනත (Gratuity Act) ඉන් පසුව සම්මත වී ඇත.

එසේම R2 දරන ලේඛනය අනුව විෂමාචාර චෝදනාවට වරද පිළිගෙන ඇත. R5 a ලේඛනය සමග ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විසින් ම ලිඛිතව එකී කරුණ තහවුරු කර ඇත.

R6a දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන් As an ex gratia payment (අමතර දීමනාවක්) වශයෙන් රු, 350,000/- ලබාගෙන ඇත.

1996(1) SLR 70 ජේරාජ් ප්‍රනාන්දුපුල්ලේ එදිරිව ප්‍රේමචන්ද්‍ර ද සිල්වා දරන නඩුවේ තීරණය වනුයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය දෙනු ලැබූ තීන්දුවක් හෝ තීරණයක් අවසන් තීරණයක් වන බවත්, එය වෙනස් කිරීමේ බලයක් නොමැති බවයි. ඒ අනුව X6 a දරන තීන්දුව අවසන් සහ අවසානාත්මක තීන්දුවක් වේ. ඉහත කරුණු අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලීම නිශ්ප්‍රභ කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ද ප්‍රකාශ කරමි.

සුනිල් වීරකෝන්,
බේරුම්කරු.

2023 ක් වූ පෙබරවාරි මස 06 වැනි දින දී ය.

EOG 04 – 0027

මගේ අංකය: IR/COM/02/2020/118.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.08.20 දිනැති හා අංක 2293/70 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.08.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොණරාගල, ජයසේන්ගම, අංක 39 හි පදිංචි එච්.එම්. රාජා කුමාරතුංග මයා සහ 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2. මොණරාගල ඩිපෝව හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු-නීතිඥ ආචාර්ය කාංචන සිල්වා මැතිතුමා ඉදිරිපිට දී ය,
ගොනු අංකය : IR/COM/02/2020/118.
බේරුම්කරණ අංක : A/40/2022.

1. එච්. එම්. රාජා කුමාරතුංග මයා
   39, ජයසේන්ගම,
   මොණරාගල.

*පළමු පාර්ශ්වය*

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
   අංක 200, කිරුළ පාර,
   කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
   මොණරාගල ඩිපෝව.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල,

කම්කරු අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත අංක සඳහන් බේරුම්කරණ යොමුවට (Reference of Arbitration) අදාළ කාර්මික ආරාවුල පහත පරිදි වේ.

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මොණරාගල ඩිපෝවේ ඩිපෝ ආරක්ෂක අංශයේ සේවය කරමින් සිටි එච්.එම්. රාජා කුමාරතුංග මයාගේ සේවය තහනම් කළ 2016.07.06 දින සිට සේවය නැවත ලබාදුන් 2017.02.12 දින දක්වා කාලයට වැටුප අහිමි කිරීමෙන් හා වැටුප් වර්ධක මාස 06කින් පසුපසට දැමීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**පෙනී සිටීම -**

පළමු පාර්ශ්වය සමග නියෝජිත මයිකල් හෙට්ටිආරච්චි මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරිනී දිමුතු පනංගල මහත්මිය සමග පෙනී සිටී.

**ප්‍රදානය -**

පළමු පාර්ශ්වය විසින් දිගින් දිගටම ඉල්ලා සිටින ලද්දේ;

01. අසාධාරණ විනය නියෝග බල රහිත කර දෙන ලෙසත්,
02. අයුක්තිය හා අසාධාරණ ලෙස මාගේ සේවය වේතන රහිතව තහනම් කර තිබූ කාලයේ සම්පූර්ණ හිඟ වැටුප දෙවන පාර්ශ්වකරුගෙන් අය කර දෙන ලෙසත්,
03. මෙම ආරාවුලෙන් මා හට කරන ලද පීඩනය හා අවමානය සැලකිල්ලට ගෙන සාධාරණ වන්දි මුදලක් දෙවන පාර්ශ්වකරුගෙන් අය කර දෙන ලෙසත්ය.

අනතුරුව සිදු කරන ලද සමථ යෝජනාව ලෙස;

01. පළමු පාර්ශ්වකරුගේ සේවය තහනම් කළ 2016.07.06 වැනි දින සිට සේවය නැවත ලබාදුන් 2017.02.12 දින දක්වා කාලයට අහිමි කළ සම්පූර්ණ වැටුප ගෙවීමට ද,
02. මෙම ආරාවුලට තුඩු දුන් අභියාචන නියෝගය ඉදිරියේදී පළමු පාර්ශ්වකරුගේ උසස්වීම්වලට හා වාර්ෂික වේතන වර්ධකයන්ට බල නොපාන ලෙසට දෙවන පාර්ශ්වකරු පිළිගැනීම වේ.

දෙවන පාර්ශ්වය විසින් ලබා දෙන පිළිතුර වූයේ;

01. ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙසත්,
02. නඩු ගාස්තු හා
03. කාර්මික අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් හා වැඩිමනත් සහන ලබා දෙන ලෙසත්ය.

එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් තත් සමථ යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

**පසුබිම:**

කතරගම ඩිපෝවේ ආරක්ෂක විමර්ශන නිලධාරීන්ගේ අංක ශ්‍රී ලංගම/කත/ආප/වීම/08/2015 හා 2016.01.11 දින දරන විමර්ශන වාර්තාව අනුව පළමු පාර්ශ්වකරු BA/448931 හා AZ438498 දරන බලපත්‍රලාභී ගිනි අවි 02 ක් සඳහා නිකුත් කර තිබූ බලපත්‍ර වංචනික ලෙස සාවද්‍යව යොදා ගනිමින් SG 12 කාණ්ඩයේ ජීව පතරොම් 24 සහ No. 04 වර්ගයේ ජීව පතරොම් 16 ක් පුද්ගලිකව තමා සන්තකයේ තබා ගනිමින් බරපතල විෂමාචාරයක් සිදු කර ඇති බව පැහැදිලි වූ බැවින් ඉල්ලුම්කරුගේ සේවය ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාවට අනුව වේතන රහිතව තහනම් කර IV වන වගන්තිය යටතේ විනය පියවර ගැනීමට යොමුකර ඇත.

ඒ අනුව ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවට අනුව පළමු පාර්ශ්වකරු 2016.07.16 දින වේතන රහිතව සේවය තහනම් කර ඇත.

පළමු පාර්ශ්වකරුට විරුද්ධව අංක ශ්‍රී ලංගම/මාසක/විනය/117/119/2016 හා 2016.09.02 දිනැති චෝදනා පත්‍රය අනුව පහත චෝදනා නගා ඇත.

01. ඩිපෝවට අයත් BA/448931 හා AZ438498 දරන බලපත්‍රලාභී ගිනි අවි සඳහා 2009.12.07 හා 2013.04.04 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් නිකුත් කරන ලද ජීව පතරොම් 80 ක් ඩිපෝවට බාර නොදී වංචනික ලෙස තමා සන්තකයේ තබා ගැනීමෙන් බරපතල විෂමාචාරයක් සිදුකිරීම.

02. දිස්ත්‍රික් ලේකම් වන රජයේ උසස්තම පරිපාලන නිලධාරියෙකු හා එම ආයතනය ශ්‍රී ලංගමය කෙරෙහි තිබූ කීර්තිනාමයට හානිවන අයුරින් කටයුතු කිරීම.

03. වගකිවයුතු ආරක්ෂක නිලධාරියෙකු ලෙස අසත්‍ය ප්‍රකාශ ලබාදීම තුළින් මණ්ඩලය හා ඩිපෝ කළමනාකාරිත්වය නොමග යැවීමට කටයුතු කිරීම තුළින් මණ්ඩලීය විනය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම.

04. වගකිවයුතු ආරක්ෂක නිලධාරියෙකු ලෙස බලපත්‍රලාභී ජීව උණ්ඩ පරිබාහිරව පුද්ගලයකු සන්තකයට පත් කිරීමේ අරමුණින් හෝ තම පුද්ගලික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කිරීමක් හෝ එසේ කිරීමට තැත් කිරීම.

05. උක්ත චෝදනාවන්ට අයත් ගිනි අවි සඳහා ලබා ගත් පතරොම් පිළිබඳව ලේඛන නඩත්තු නොකිරීම.

06. ඉහත සඳහන් චෝදනා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම තුලින් මණ්ඩලය තැබූ විශ්වාසය කඩ කිරීම.

පළමු පාර්ශ්වකරු සම්බන්ධයෙන් පවත්වන ලද ශ්‍රී ලංගම/මාසක/විනය/117/119/2016 හා 2016.09.02 දිනැති චෝදනා පත්‍රය යටතේ පැවති විනය පරීක්ෂණය අනුව 02,05,06 චෝදනාවන්ට පළමු පාර්ශ්වකරු වරදකරු වී ඇති බවත්, පළමු පාර්ශ්වකරුගේ සේවය තහනම්ව සිටි අවදියේදී නොගෙවන ලද වේතනය අහිමි කරමින් පහත දඬුවම් නියම කර ඇත.

01. සේවය තහනම් අවදියේ නොගෙවන ලද වේතන අහිමි කරමින් ඉදිරියට මාස දෙකක (02) කාලයකට සේවය තාවකාලිකව අත්හිටුවීම.

02. සැලකිලිමත්ව රාජකාරිය ඉටු කරන ලෙසට අවවාද කිරීම.

එම විනය නියෝගයට විරුද්ධව පළමු පාර්ශ්වකරු විසින් අභියාචනයක් කරන ලද අතර අභියාචනා නියෝගය මගින් විනය නියෝගයෙන් පමුණුවන ලද දඬුවම් පහත පරිදි සංශෝධනය කර ඇත.

01. සේවය තහනම් කර සිටි කාලය දඬුවමට යටත් කිරීම.
02. සැලකිලිමත් ලෙස රාජකාරි කරන ලෙසට තරයේ අවවාද කිරීම.

තත් කරුණු සියල්ල සලකා බැලීමේදී පළමු පාර්ශ්වයට එරෙහිව පනවා ඇති විනය දඬුවම් සාධාරණ හා යුක්ති සහගත බවට ප්‍රකට වේ. ඔහුගේ අභියාචනය පිළිබඳව ද දෙවන පාර්ශ්වය සලකා බලා ඇති අතර ඒ අනුව දඬුවම් සංශෝධනය කර ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වය සම්බන්ධයෙන් ලබාදී ඇති විනය නියෝගය නිත්‍යානුකූල හා සාධාරණ බව නිගමනය කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ද සටහන් කරමි.

නීතිඥ ආචාර්ය කාංචන සිල්වා,
(බේරුම්කරු).

2023 පෙබරවාරි මස 16 වැනි දින දී ය.

EOG 04 – 0029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.